## මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ
## ග්‍රාම සංවර්ධන නිළධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටිය

1. සම්බන්ධ වන ආයතන:-

    1.1. දෙපාර්තමේන්තුව:- මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව
    යොමු අංකය: CPC/RD/01/2/29 දිනය: 2014.03.10

    1.2. අමාත්‍යාංශය:- මධ්‍යම පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු, වනිතා, ග්‍රාමීය සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය.
    යොමු අංකය: සීපීසී/එම්අයි/එච්ආර්එම්/05/15/07 දිනය: 2014.03.31

    1.3. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය:
    යොමු අංකය: සීපීසී/සීඑස්/1/4/1/5/2 දිනය: 2014.06.23

2. ක්‍රියාත්මක වන දිනය:- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වගන්තිය අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිළධාරි සේවයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා වූ මෙම පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කරන ලද දින සිට ක්‍රියාත්මක වේ.

3. මෙම ස්ථාන මාරු පරිපාටිය මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිළධාරීන් මධ්‍යම පළාත තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර ස්ථාන මාරු කිරීම සඳහා අදාළ වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය වේ.

4. මෙම ස්ථාන මාරු පරිපාටියට අනුව අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන ස්ථාන මාරු මණ්ඩලයක් මගින් වාර්ෂික ස්ථාන මාරු සඳහා කැඳවනු ලබන අයැදුම්පත් සහ අදාළ අනෙකුත් විස්තර සළකා බලා ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂ විසින් ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කරනු ලැබේ.

5. වාර්ෂික ස්ථාන මාරුවලින් පරිබාහිරව අනුමත කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව නොඉක්මවන පරිදි පහත දැක්වෙන හේතු මත ස්ථාන මාරුවක් කළ යුතු යැයි අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා අදහස් කරන විට ඒ සඳහා ඔහුට බලය පැවරේ. එවැනි ස්ථාන මාරුවීමකින් අතෘප්තිමත් වන සේවකයන් හට මධ්‍යම පළාත් අමාත්‍යාංශ ලේකම් වෙත අභියාචනා කිරීමට හැකිවේ.

    5.1. සේවා අවශ්‍යතාවය මත
    5.2. අන්‍යෝන්‍ය ස්ථාන මාරු මත
    5.3. පත්කල රජයේ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ මත
    5.4. සේවා ස්ථානයේ වෙනසක් නොවන මාරුකිරීම්
    5.5. විනය හේතූන් මත

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-11-05 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

6. වාර්ෂික ස්ථාන මාරුවීම්

    6.1. ස්ථාන මාරුවීම අපේක්ෂා කරන සේවකයන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය ක්‍රියාත්මක කෙරේ.

    6.2. මාරු මණ්ඩලය ස්ථාපනය කිරීම.
    මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන නිළධාරීන්ගේ ස්ථාන මාරු මණ්ඩලය වාර්ෂිකව හෝ අවශ්‍ය පරිදි කලින් කලට ස්ථාපනය කෙරේ.

    6.3. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක 10.1 ඡේදය යටතේ නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිළධාරියෙකුට අනුයුක්ත කිරීමට අනුමැතිය දී ඇති මධ්‍යම පළාතේ වෙනත් ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයකට ස්ථාන මාරුවීමක් ලබා ගැනීමට අයැදුම් කළ හැකිය.

    6.4. එවැනි අයැදුම්පත් පළමු පරිශිෂ්ඨයෙහි පරිදි පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

    6.5. ස්ථාන මාරුවීම්වලදී සලකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති පහත පරිදි වේ.
        6.5.1. වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී සුදුසුකම් ලබන සේවා කාලය ගණනය කරනු ලබන්නේ පවත්නා වර්ෂයේ ඔක්තෝබර් 01 දිනටය.

6.5.2. සේවා කාලය ගණනය කිරීමේ දි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

6.5.3. යම් නිළධාරියකු එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක වසර 03 ක සේවයේ නිරතව සිටීනම් අතිදුෂ්කර, දුෂ්කර හා ප්‍රියමනාප නොවන හා ප්‍රියමනාප සේවා ස්ථානයන් හි සේවා කාලය සම්පූර්ණ කළ සේවකයින්ට ස්ථාන මාරු ලබාදීමට හැකි වන පරිදි ඔහුගේ කැමැත්ත නොමැතිවද ස්ථාන මාරුවක් ලැබීමට යටත් වනු ඇත.

6.5.4. නියමිත කාලය සම්පූර්ණ කර ඇති විට වාර්ෂික ස්ථාන මාරු සඳහා අයැදුම් කිරීම නිළධාරියාගේ වගකීම වන අතර එසේ අයැදුම් නොකරන නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති සේවකයන් ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි පුරප්පාඩු ඇතිවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ස්ථාන මාරු කරනු ලැබේ.

6.5.5. ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය ස්ථාන මාරුව ක්‍රියාත්මක වන වසරේ මාරු මණ්ඩලය තීරණය කරන දිනය වේ.

6.5.6. මාරුවීම් අපේක්ෂා නොකරන ප්‍රියමනාප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධාරීන් තමා ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ වුවද ස්ථාන මාරු කළහොත් යාමට අපේක්ෂිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහන් කර තෙවැනි පරිශිෂ්ඨය අනුව තොරතුරු තම සේවා ප්‍රධානියා මගින් අයැදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් බලධාරියා වෙත නියමිත දිනට පෙර අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු වේ.

6.5.7. ඉහත 6.5.6 ඡේදයේ සඳහන් තෙවැනි පරිශිෂ්ඨය අනුව තොරතුරු ඉදිරිපත් කළ හා ඉදිරිපත් නොකළ වසර 03 කට වැඩි සේවා කාලයක් සහිත නිළධාරීන් පිළිබඳ තොරතුරු සිව්වන පරිශිෂ්ඨය අනුව නිවැරදිව සම්පූර්ණ කර පවත්වා ගැනීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීම වේ.

7. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතර වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමේ දී අනුමත ස්ථානමාරු පරිපාටියක් අනුව වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ මත අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කල යුතුය.

8. සේවා ස්ථාන වර්ගීකරණය

ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා නිළධාරීන් සේවයෙහි යෙදී ඇති මධ්‍යම පළාත තුළ පවතින එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහත පරිදි වර්ග කරනු ලැබේ. (ස්ථාන මාරු වර්ගීකරණය දෙවන වන පරිශිෂ්ඨයෙහි දැක්වේ ).

A වර්ගය - ප්‍රියමනාප
B වර්ගය - ප්‍රියමනාප නොවන
C වර්ගය - දුෂ්කර
D වර්ගය - අති දුෂ්කර

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-11-05 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

9. ස්ථාන මාරුවක් ඉල්ලීමේදී සැලකිල්ලට ගනු ලබන කරුණු .

9.1. ස්ථාන මාරුවක් ඉල්ලීමේ දි සපුරාලිය යුතු අවම සේවා කාලය

9.1.1. අති දුෂ්කර සේවා ස්ථානයක (D) අවම වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධාරියෙකුට ස්ථාන මාරුවීමක් අපේක්ෂා කළ හැකි වේ.

9.1.2. දුෂ්කර සේවා ස්ථානයක (C) අවම වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධාරියෙකුට ස්ථාන මාරුවීමක් අපේක්ෂා කළ හැකි වේ.

9.1.3. ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක (B) අවම වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධාරියෙකුට ස්ථාන මාරුවීමක් අපේක්ෂා කළ හැකි වේ.

9.1.4. ප්‍රියමනාප ඕනෑම සේවා ස්ථානයක (A) වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධාරියෙකු ස්ථාන මාරුවකට අනිවාර්යයෙන්ම යටත් විය යුතුය.

9.2. ස්ථාන මාරුවීමක් ලබාගැනීම සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමය.

9.2.1. සේවය කරන දිස්ත්‍රික්කය /ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අනුව නිළධාරියෙකුට ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය 70 කි.

9.2.2. ඉහත අංක 8 හි දැක්වෙන සේවා ස්ථාන වර්ගීකරණය අනුව ඒ ඒ සේවා ස්ථානවල සේවය කර ඇති කාලසීමාව සැළකිල්ලට ගෙන නිළධාරීන් හට පහත දැක්වෙන පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

9.2.2.1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව

A. ප්‍රියමනාප - පූර්ණ වර්ෂයකට ලකුණු 01 යි.
B. ප්‍රියමනාප නොවන - පූර්ණ වර්ෂයකට ලකුණු 02 යි.
C. දුෂ්කර - පූර්ණ වර්ෂයකට ලකුණු 03 යි.
D. අති දුෂ්කර - පූර්ණ වර්ෂයකට ලකුණු 04 යි.

වසරකට අඩු එහෙත් මාස 06 ක හෝ ඊට වැඩි සේවා කාලයක් යම් සේවා ස්ථානයක සේවය කර ඇත්නම් ඔහුට අදාළ සේවා ස්ථානය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය දිස්ත්‍රික්කය අනුව අදාළ සේවා ස්ථානයට හිමි ලකුණු ප්‍රමාණයෙන් 50% ක් හිමි වේ.

9.2.3. නිළධාරියා සේවය කළ කාලය සලකා ඉහත පරිදි ලකුණු ලබාදීමට අමතරව ස්ථාන මාරු පහත සඳහන් කරුණුද අනුව ඇගයීමකට ලක් කර ලකුණු ලබාදීමක් සිදු කෙරේ.

| | | |
|---|---|---|
| a. | ස්ථිර පදිංචිය | 05 |
| b. | කලත්‍රයාගේ රැකියා ස්ථානය | 05 |
| c. | පාසල් යන දරුවන් සිටීම | 05 |
| d. | මාරු මණ්ඩලයේ අභිමතය පරිදි සැළකිල්ලට ගත් විශේෂ කරුණු | 05 |
| e. | නිළධාරීන්ගේ කාර්යසාධන ඉලක්ක සපුරාගැනීම (කාර්යසාධන වාර්තාවේ පිටපතක් ඇමිණිය යුතුය) | 10 |
| | | 30 |

9.3. දෙවන පරිශිෂ්ඨයේ සඳහන් වර්ගීකරණය අනුව ස්ථාන මාරුවක් ලබාගැනීමට සපුරාලිය යුතු මුළු සේවා කාලය පහත සඳහන් පරිදි වේ.

A. වසර 03 ක මුළු සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
B. වසර 03 ක මුළු සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
C. වසර 03 ක මුළු සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
D. වසර 03 ක මුළු සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-11-05 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

10. ස්ථාන මාරු ඉල්ලා නොසිටින එහෙත් දෙපාර්තමේන්තුවේ සේවා කාලය සම්පූර්ණ කළ නිළධාරීන්ට ස්ථාන මාරු ලබා දීම සඳහා ක්‍රියා පරිපාටිය.

10.1. ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක හෝ දුෂ්කර හෝ අති දුෂ්කර සේවා ස්ථානයක සේවය කළ නිළධාරියෙකුට ස්ථාන මාරුවක් ඉල්ලූ විට එම ඉල්ලීම ඉටු කිරීමට ඔහු ස්ථාන මාරුව ඉල්ලා ඇති එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක වැඩිම සේවා කාලයක් සේවය කර ඇති නිළධාරියාට සේවා කාලය මත උපරිම ලකුණු 100 ක් ලබාදෙන අතර ඊට අඩු සේවා කාලයක් ඇති නිළධාරීන් හට සමානුපාතිකව ලකුණු ගණනය කරනු ලැබේ.

10.2. එවැනි ලකුණු ගණනය කරන ලද නිළධාරීන් සම්බන්ධව පරිපාටියේ 9.2.3 යටතේ කරුණු ද ඇගයීමට ලක් කර ලකුණු ලබා දී එම ලකුණු සේවා කාලයට ලබාදෙන ලද ඉහත ලකුණු ප්‍රමාණයෙන් අඩු කරනු ලැබේ. පසුගිය වසර 05 තුළ කාර්යසාධක දර්ශක 100% ක් සපුරාගත් බව සනාථ කෙරෙන පිළිගත හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන නිළධාරීන් හට එක් වර්ෂයකට ලකුණු 02 බැගින් ලකුණු 10 ක් අඩු කරනු ලැබේ.

10.3. ඒ අනුව ස්ථාන මාරුවක් ඉල්ලූ නිළධාරියාගේ ඉල්ලීම ඉටු කිරීම සඳහා එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිළධාරියා ඉන් පිටතට ස්ථාන මාරු කළ යුතුය.

11. පළමු වන පරිශිෂ්ඨය පරිදි ස්ථාන මාරු ඉල්ලුම්පත්‍රය 15 වන වගන්තියේ දැක්වෙන පරිදි එකී දිනයන්ට පෙරාතුව කළ යුතු වේ.

12. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම

12.1. වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය පහත සඳහන් නිළධාරීන්ගෙන් සමන්විත වේ.

a. පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙකු
b. අමාත්‍යාංශ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු
c. මධ්‍යම පළාත තුළ මෙම සේවයට අයත් නිලධාරීන්ගෙන් 15% කට වඩා වැඩි සංඛ්‍යාවක් සාමාජිකත්වය දරණ ලියාපදිංචි හා අනුමත වෘත්තීය සංගම්වල නියෝජිතයින් එක් අයෙකු බැගින්

12.2. මෙම ස්ථාන මාරු මණ්ඩලය ලැබී ඇති අයැදුම්පත් හා අනෙකුත් විස්තර සලකා බලා සිය යෝජනා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

12.3. යෝජිත වාර්ෂික ස්ථාන මාරු වලින් අතෘප්තියට පත්වන නිළධාරීන් සිය අභියාචනා හතරවෙනි පරිශිෂ්ඨයට අනුව සකසා ඉදිරිපත් කළ යුතුය. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනුයේ පළමු පරිශිෂ්ඨයේ හෝ දෙවැනි පරිශිෂ්ඨය මගින් ඉල්ලීම් ඉදිරිපත් කළ නිළධාරීන් හට පමණි. මෙම අභියාචනය තම සේවා ප්‍රධානියා මගින් අමාත්‍යාංශ ලේකම් වෙත එවිය යුතුය.

12.4. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ නිළධාරීන් තිදෙනෙකුගෙන් සමන්විතව අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ඇත.

12.5. සෑම වසරකම ඔක්තොබර් 15 දිනට ප්‍රථම මෙම සමාලෝචන කමිටුව විසින් ඉදිරිපත්ව ඇති අභියාචනා සලකා බලා සිය නිර්දේශ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එම නිර්දේශ සඳහා පදනම් වූ හේතු ද එම වාර්තාවෙහි අඩංගු විය යුතුය.

12.6. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ යෝජනා ද වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂ විසින් වාර්ෂික ස්ථාන මාරු නියෝග නොවැම්බර් 01 දිනට පෙර නිකුත් කළ යුතුය.

12.7. වාර්ෂික ස්ථාන මාරු ලබන සියළු නිළධාරීන් නියමිත දිනට එම නියෝග පරිදි නියමිත බලධාරීන් වෙත රාජකාරියට වාර්තා කළ යුතුය.

12.8. මෙම ස්ථාන මාරු නියෝග වලින් අතෘප්තියට පත්වන නිළධාරීන් හට අමාත්‍යාංශ ලේකම් වෙත අභියාචනා කළ හැක. එම අභියාචනා පස්වෙනි පරිශිෂ්ඨය පරිදි ඉදිරිපත් කළ යුතු වේ.

13. වයස අවු 55 ට වැඩි නිළධාරියෙකු එකී නිළධාරියාගේ කැමැත්තක් නොමැතිව මෙම පරිපාටිය අනුව ස්ථාන මාරුවීම් වලට භාජනය නොවනු ඇත.

14. ස්ථාන මාරුවීම් සඳහා කාල සටහන **

14.1. ස්ථාන මාරුවීම් ඉල්ලීම් භාරගන්නා අවසාන දිනය - ජූලි 31 දිනට පෙර
14.2. දෙපාර්තමේන්තු ප්‍රධානියා තොරතුරු සැපයිය යුතු අවසන් දිනය - අගෝස්තු 10 දිනට පෙර
14.3. ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම - සැප්තැම්බර් 15 දිනට පෙර
14.4. ස්ථාන මාරුවට එරෙහිව අභියාචනා ඉදිරිපත් කල යුතු අවසන් දිනය - සැප්තැම්බර් 30 දිනට පෙර
14.5. අභියාචනා තීරණ මත අවසාන ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කිරීම - නොවැම්බර් 01 දිනට පෙර

** මෙම කාල පරාසයට අනුකූලව දින වකවානු වෙනස් කිරීමේ බලය අමාත්‍යාංශ ලේකම් සතුවේ.

15. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියා පරිපාටිය ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධානවලට යටත්ව සකසා ඇත.

16. පාලනය

16.1. මෙම වාර්ෂික ස්ථාන මාරු පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-11-05 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍යසේවා කොමිෂන් සභාවේ නිර්දේශය -: නිර්දේශ කරමු.

01. එස්.බී. බැද්දේවෙල මහතා (සභාපති) ..........................................

02. යූ .ඒ.බෝගහපිටිය මහතා (සාමාජික) ..........................................

03. ජී.ජී.එස්.ඒ. දිසානායක මිය (සාමාජික) ..........................................

04. වී. නන්දකුමාර් මහතා (සාමාජික) ..........................................

05. ඒ.එම්.එම්.ජේ. නිස්තාර් මහතා (සාමාජික) ..........................................

දිනය 2014-10-14

ආණ්ඩුකාර ලේකම්,

2014-10-14 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 14/1368 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරේ ස්ථාන මාරු පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2014.10.30

..........................................
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍යසේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව

ආර්. එම්. එන්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය.

අනුමත කරමි / ~~නොකරමි~~
..........................................
ටිකිරි කොබ්බෑකඩුව
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2014.11.01

## පළමු පරිශිෂ්ටය

## මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන නිළධාරි වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය

1. දැනට සේවය කරන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය :-..............................................................
   1.1. එම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය අයත් දිස්ත්‍රික්කය :-..............................................
   1.2. අදාළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට පත් කල දිනය :-..................................................

2. නිලධාරියාගේ සම්පූර්ණ නම :-.........................................................................................

.........................................................................................................................................

   2.1. ජාතික හැඳුනුම්පත් අංකය :-.........................................................

3. ස්ථිර පෞද්ගලික ලිපිනය :-.............................................................................................

.........................................................................................................................................

   3.1. දැනට පදිංචි ස්ථානයේ ලිපිනය :- ..................................................................
   .........................................................................................................................................

   3.2. දුරකථන අංකය :-...........................................

4. උපන් දිනය :-............................................ වයස:-

| අවු: | මාස | දින |
|---|---|---|
| | | |

   4.1. ස්ත්‍රී /පුරුෂභාවය :-..............................

5. නිලධාරියා විවාහකද /අවිවාහකද යන බව :-.................................................................

   5.1. දරුවන් පිළිබඳ තොරතුරු (අදාළ වේ නම්)

| දරුවන්ගේ නම් | වයස | ඉගෙනුම ලබන පැසැල |
|---|---|---|
| | | |
| | | |
| | | |

   5.2. කලත්‍රයාගේ නම :-.........................................................................................
      5.2.1. කලත්‍රයාගේ සේවා ස්ථානය :-...................................................................
      5.2.2. කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ සේවයේ ක්‍රියාත්විත සේවයේ නියුතු ද?:-
      5.2.3. එසේනම් ඔහු / ඇය අයත් වන සේවාව හා තනතුර:-..............................................
      .........................................................................................................

   5.3. ග්‍රාම සංවර්ධන නිළධාරි සේවයේ දැනට දරන තනතුර:- ..................................................
      5.3.1. දැනට සිටින පන්තිය හෝ ශ්‍රේණිය:-.....................................................................
      5.3.2. එම පන්තියට/ශ්‍රේණියට පත්වූ දිනය :-.............................................................
      5.3.3. මුල් පත්වීම් දිනය:- ...............................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-11-05 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

6. සේවයට ඇතුළත් වූ දින සිට මේ දක්වා එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සේවය කර ඇති සේවා විස්තරය. (අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සැපයීම නොකළ යුතුය)

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වර්ගීකරණය අනුව සේවා ස්ථානයේ වර්ගය (A,B,C,D) | | කාලසීමාව | | මුළු සේවා කාලය | සේවය කරන ලද සේවා ස්ථානය අනුව තමන් විසින් අපේක්ෂා කරනු ලබන ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| | දිස්ත්‍රික්කය | ප්‍රා:ලේ:කො: | සිට | දක්වා | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

7. කාර්යසාධන ඉලක්ක සපුරාගැනීම පිළිබඳ විස්තර (සනාථ කිරීම සඳහා ලිඛිත තොරතුරු සපයා තිබීම අත්‍යවශ්‍යයි.):- ..................................................................................................

..................................................................................................................................

8. ස්ථාන මාරුව ඉල්ලා සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :-
   8.1. ..........................................................................................
   8.2. ..........................................................................................
   8.3. ..........................................................................................

9. ස්ථාන මාරු ඉල්ලීමට හේතු
   9.1. ..........................................................................................................
   9.2. ..........................................................................................................
   9.3. ..........................................................................................................

10. විශේෂයෙන් සඳහන් කිරීමට හේතු ඇත්නම්:-..........................................................................
   ..................................................................................................................................
   ..................................................................................................................................
   ..................................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය :-.................................                                  .................................

නිලධාරියාගේ අත්සන

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-11-05 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

II කොටස

ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව නිළධාරියා මුදා හැරිය හැකිය.

දිනය :-............................

................................
අත්සන හා නිල මුද්‍රාව

---

පළාත් අධ්‍යක්ෂගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව නිළධාරියා මුදා හැරිය හැකිය.

දිනය :-............................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-11-05 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්

................................
අත්සන හා නිල මුද්‍රාව

දෙවන පරිශිෂ්ඨය

සේවා ස්ථාන වර්ගීකරණය

| දිස්ත්‍රික්කය | ප්‍රිය මනාප - A | ප්‍රිය මනාප නොවන - B | දුෂ්කර - C | අති දුෂ්කර - D |
|---|---|---|---|---|
| මහනුවර | ගඟවට කෝරළේ | පූජා පිටිය | උඩදුම්බර | |
| | හාරිස්පත්තුව | කුණ්ඩසාලේ | මිණිපේ, හසලක | |
| | යටිනුවර | මැදදුම්බර | පන්විල | |
| | උඩ පළාත | තුම්පනේ | | |
| | අකුරණ | හතරලියද්ද | | |
| | පාතහේවාහැට | පස්බාගේ කෝරළේ | | |
| | පාතදුම්බර | ගඟඉහල කෝරළේ | | |
| | උඩුනුවර | දොළුව | | |
| | | දෙල්තොට | | |
| මාතලේ | මාතලේ | දඹුල්ල | ගලේවෙල | විල්ගමුව |
| | උකුවෙල | යටවත්ත | අඹන්ගඟ කෝරළේ | ලග්ගල පල්ලේගම |
| | | රත්තොට | | |
| | | නාඋල | | |
| | | පල්ලේපොල | | |
| නුවරඑළිය | නුවරඑළිය නගර සීමාව | | අඹගමුව | වලපනේ |
| | හඟුරන්කෙත | | කොත්මලේ | |
| | | | | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-11-05 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

තෙවෙනි පරිශිෂ්ඨය

## මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන නිළධාරීන් ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම් නොකරන නිළධාරීන් සම්පූර්ණ කළ යුතු අයදුම්පත්‍රය

1. දැනට සේවය කරන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය :-..........................................................
   1.1. එම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය අයත් දිස්ත්‍රික්කය :-................................................

2. නිලධාරියාගේ සම්පූර්ණ නම :-...........................................................................................
.......................................................................................................................................
   2.1. ජාතික හැඳුනුම්පත් අංකය :-........................................................

3. ස්ථිර පෞද්ගලික ලිපිනය :-.................................................................................................
.......................................................................................................................................

   3.1. දැනට පදිංචි ස්ථානයේ ලිපිනය :- ........................................................................
   .................................................................................................................................
   3.2. දූරකථන අංකය :-..........................................

4. උපන් දිනය :-............................................ වයස:-

| අවු: | මාස | දින |
|---|---|---|
| | | |

   4.1. ස්ත්‍රී /පුරුෂභාවය :-...............................

5. නිලධාරියා විවාහකද /අවිවාහකද යන බව :-.........................................................................
   5.1. කලත්‍රයාගේ නම :-..........................................................................................
      5.1.1. කලත්‍රයාගේ සේවා ස්ථානය :-.................................................................
      5.1.2. කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ සේවයේ ක්‍රියාන්විත සේවයේ නියුතු ද?:-....
      5.1.3. එසේනම් ඔහු / ඇය අයත් වන සේවාව හා තනතුර:-.............................................
      ..........................................................................................................................

   5.2. දරුවන් පිළිබඳ තොරතුරු (අදාළ වේ නම්)

| දරුවන්ගේ නම | වයස | ඉගෙනුම ලබන පැසැල |
|---|---|---|
| | | |
| | | |
| | | |

6. මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන නිළධාරි තනතුරෙහි විස්තර
   6.1. දැනට සිටින පන්තිය හෝ ශ්‍රේණිය:-
   ..........................................................................................
   6.2. එම පන්තියට/ශ්‍රේණියට පත්වූ දිනය :-
   ......................................................................................
   6.3. මුල් පත්වීම් දිනය:- ..................................................

7. වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්කර නොමැති බැවින් ස්ථාන මාරුවක් ලබා දුනහොත් සේවය කිරීමට
   කැමති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 03 ක් (කැමැත්ත අනුපිළිවෙලින්)
   7.1. ....................................................................................
   7.2. ....................................................................................
   7.3. ....................................................................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-11-05 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

8. විශේෂයෙන් සදහන් කිරීමට හේතු ඇත්නම්:-....................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

දිනය :-.................................. ..................................
නිලධාරියාගේ අත්සන

---

ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව නිළධාරියා මුදා හැරිය හැකිය.

දිනය :-............................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-11-05 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

................................
ප්‍රාදේශීය ලේකම්ගේ
අත්සන හා නිල මුද්‍රාව

හතරවෙනි පරිශිෂ්ඨය

(තමා අනුයුක්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය )

නම:-.......................................................

තනතුර:-..................................................

ලිපිනය:-..................................................

දිනය:-.....................................................

..........................................................................මගින්,

..........................................................................අමාත්‍යාංශයේ ලේකම්.

<u>යෝජිත වාර්ෂික ස්ථාන මාරුව සම්බන්ධයෙන් කරුණු දැක්වීම</u>

ඔබගේ අංක ............................................... හා .................................... දිනැති ලිපිය /යෝජිත වාර්ෂික ස්ථාන මාරු ලේඛනය මගින් මා ..........................................................................................ට ස්ථාන මාරු කිරීමට යෝජිත බව දන්වා ඇත./ අයැදුම්පත ප්‍රතික්ෂේප වී ඇති බව දන්වා ඇත. /මවිසින් ඉදිරිපත් කළ ........................................ දිනැති ස්ථාන මාරු අයැදුම්පත්‍රය අනුව ස්ථාන මාරු ලබාදී නොමැත.

02. පහතින් විස්තර කරනු ලබන කරුණු මත එම යෝජිත ස්ථාන මාරුව අවලංගු කරන ලෙස /සංශෝධනය කරන ලෙස /නැවත සලකා බලන ලෙස /ස්ථාන මාරුවක් ලබා දෙන ලෙස /ප්‍රතික්ෂේපිත අයැදුම්පත නැවත සළකා බලන ලෙස ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

I. ...........................................................................................................................................

II. ...........................................................................................................................................

III. ...........................................................................................................................................

03. ඉහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා අදාළ පහත සඳහන් ලියවිලි වල සහතික කළ ඡායා පිටපත් මේ සමග යා කර ඇත.

04. මාගේ වාර්ෂික ස්ථාන මාරුව පහත සඳහන් සේවා ස්ථානයකට ලබාදෙන ලෙස ද ඉල්ලමි.

I. ....................................................................................................

II. ....................................................................................................

III. ....................................................................................................

දිනය :-.................................

.................................

නිලධාරියාගේ අත්සන

---

ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව නිළධාරියා මුදා හැරිය හැකිය.

දිනය :-...........................

.......................................

අත්සන

නම, තනතුර හා නිල මුද්‍රාව

---

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව නිළධාරියා මුදා හැරිය හැකිය.

දිනය :-...........................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-11-05 ..දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

.......................................

අත්සන

නම, තනතුර හා නිල මුද්‍රාව

පස්වෙනි පරිශිෂ්ටය

මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන නිළධාරි සේවයේ වාර්ෂික ස්ථාන මාරු කිරීම සම්බන්ධව
ඉදිරිපත් කරනු ලබන අභියාචනය

1. නිළධාරියා පිළිබඳ විස්තර
   1.1. සම්පූර්ණ නම :-..................................................................................................
   ..........................................................................................................................
   1.2. අයත්වන ශ්‍රේණිය:-...... ...............................
   1.3. සේවා ස්ථානය:-........... ..............................
2. අභියාචනයට පදනම් ව ඇති තීරණය/නියෝගය පිළිබඳව විස්තර
   2.1. තීරණය නියෝගය කුමක් ද යන වග සැකෙවින් :-.......................................................
   ..........................................................................................................................
   ..........................................................................................................................
   2.2. තීරණය /නියෝගය දෙන ලද්දේ කා විසින් ද ?:-..........................................................
   2.3. තීරණය /නියෝගය නිළධාරියාට ලැබුන දිනය:- ......................
   2.4. තීරණය /නියෝගය දැක්වෙන ලිපිවල සහතික කල පිටපත් පහතින් දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.
   ඇමුණුම 1:-.................................
   ඇමුණුම 2.:-................................
3. තීරණයට /නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු
   3.1. ...................................................................................................................
   3.2. ...................................................................................................................
   3.3. ...................................................................................................................
   3.4. ...................................................................................................................
   3.5. ...................................................................................................................
   3.6. මෙම හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කල පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.
   ..........................................................................................................................
   ..........................................................................................................................
   ..........................................................................................................................

4. ඉල්ලා සිටිනු ලබන සහන :-......................................................................................
   ..........................................................................................................................
   ..........................................................................................................................
   ..........................................................................................................................

දිනය :-.................................

...................................
නිලධාරියාගේ අත්සන

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-11-05 ..දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්